# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2179/23 - 2020 ජූනි මස 12 වැනි සිකුරාදා - 2020.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) (අ) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහිමි වීම හේතුකොට ගෙන කළුතර නගර සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ අංක 10 - කුරුඳුවත්ත කොට්ඨාසයට තේරී පත් වූ මොහමඩ් ෆිරවුස් මොහමඩ් ෆස්ලාන් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කළුතර නගර සභාවේ අංක 10 - කුරුඳුවත්ත කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා එදිරිමුණි චමින්ද සුරංග ද සොයිසා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කළුතර නගර සභාවේ තේරීම්භාර නිලධාරී, වන්නකුවත්ත වඩුගේ කාලින්ද ජයවීර ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) (අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් එදිරිමුණි චමින්ද සුරංග ද සොයිසා, කළුතර නගර සභාවේ අංක 10 - කුරුඳුවත්ත කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කාලින්ද ජයවීර ප්‍රනාන්දු,
තේරීම්භාර නිලධාරී,
කළුතර නගර සභාව.

2020 ජූනි මස 11 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර.

06 - 220

1A - G 32318 — 37 (2020/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමි වීම හේතුකොට ගෙන කළුතර නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ අංක 08 - මහවත්ත කොට්ඨාසයට තේරී පත් වූ මොහමඩ් මහරුෆ් මොහමඩ් ජවුෆර් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කළුතර නගර සභාවේ අංක අංක 08 - මහවත්ත කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ප්‍රසන්ත සමන්මාල් වරකාගොඩ විතානගේ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කළුතර නගර සභාවේ තේරීම්භාර නිලධාරි, වන්නකුවත්ත වඩුගේ කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ප්‍රසන්ත සමන්මාල් වරකාගොඩ විතානගේ, කළුතර නගර සභාවේ අංක 08 - මහවත්ත කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු,**
තේරීම්භාර නිලධාරි,
කළුතර නගර සභාව.

2020 ජුනි මස 11 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර.

06 - 221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.